සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**12 ශ්‍රේණිය** | **බෞද්ධ ශිෂ්ටාචාරය** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 2 ) | 03. ( 1 ) | 04. ( 5 ) | 05. ( 3 ) | 06. ( 2 ) | 07. ( 1 ) | 08. ( 4 ) | 09. ( 1 ) | 10. ( 5 ) |
| 11. ( 4 ) | 12. ( 3 ) | 13. ( 4 ) | 14. ( 2 ) | 15. ( 5 ) | 16. ( 5 ) | 17. ( 3 ) | 18. ( 5 ) | 19. ( 3 ) | 20. ( 4 ) |
| 21. ( 1 ) | 22. ( 3 ) | 23. ( 2 ) | 24. ( 4 ) | 25. ( 4 ) | 26. ( 2 ) | 27. ( 2 ) | 28. ( 3 ) | 29. ( 4 ) | 30. ( 2 ) |
| 31. ( 4 ) | 32. ( 5 ) | 33. ( 3 ) | 34. ( 1 ) | 35. ( 4 ) | 36. ( 3 ) | 37. ( 5 ) | 38. ( 2 ) | 39. ( 1 ) | 40. ( 3 ) |
| 41. ( 5 ) | 42. ( 3 ) | 43. ( 2 ) | 44. ( 5 ) | 45. ( 2 ) | 46. ( 3 ) | 47. ( 3 ) | 48. ( 5 ) | 49. ( 2 ) | 50. ( 3 ) |

## II කොටස

(එක් කොටසකට ලකුණු 4 බැගින් එක් ප්‍රශ්නයකට ලකුණු 20 ක් දෙන්න.)

(01) (1) 1. වේදයුගය 2. බ්‍රාහ්මණ යුගය 3. අරණ්‍යක යුගය 4. උපනිෂද් යුගය

(2) 1. ආකාශස්ථ දෙවිවරු හිරු, සඳු, තාරකා, වළාකුල් 2. භූමස්ථ දෙවිවරු ගින්න, ජලය, සජීත, ගස් ගල්
3. අන්තරීක්ෂ දෙවිවරු වැස්ස, සුළඟ, විදුලිය

(3) • නිර්මාණවාදී මහා බ්‍රහ්ම සංකල්පය බැහැර කිරීම, • ඥාන මාර්ගය ගරු කිරීම, • යාගය ප්‍රතික්ෂේප කිරීම
• නිදහස් චින්තනය ගරු කිරීම, • අත්තකිලමතානු යෝගී ප්‍රතිඥාව අනුගමනය කිරීම,
• කුලභේදය නොසලකා හැරීම. (කරුණු තුනක් කෙටියෙන් විස්තර විය යුතුය.)

(4) 1. කායදණ්ඩ, වාග් දණ්ඩ, මනෝ දණ්ඩ වශයෙන් දණ්ඩක ඉදිරිපත් කිරීම,
2. පරම අවිහිංසාවාදී දර්ශනයක් ඉදිරිපත් කිරීම, 3. කිරියවාදී සංකල්පයෙන් පුබ්බේකත හේතුවාදය ඉදිරිපත් කිරීම.

(5) 1. රාජසූය 2. පුරුෂමේධ 3. සම්මාපාය, 4. අශ්වමේධ, 5. වාජපෙය්‍ය

(02) (1) බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසී (2) මෙයින් දෙකක් හඳුන්වා තිබිය යුතුය.

(3) • ගෘහ ආශ්‍රිත යාගහෝම සඳහා ස්වාමියා සමග එකට වාඩි වී ආගමික කටයුතු කිරීම. • ස්වයංවර විවාහ ක්‍රමය යටතේ තමා කැමති සැමියකු තෝරා ගැනීමට හැකිවීම. • වැන්දඹු කාන්තාවකට නැවත විවාහවීමට හැකිවීම. • මවක ලෙස වැඳුම් පිදුම් ලැබීම. • අධ්‍යාපනය ලැබීමට ඉඩකඩ සැලසීම.

(4) • පුරුෂාධිපත්‍යයට යටත්ව සිටීමට සිදුවීම. • ළදරු විවාහ ක්‍රමය පැවතීම, • සති පූජාවට යටත්වීම, • වැන්දඹුවක ලෙස දිවි ගෙවීමට සිදුවීම.

(5) අම්බපාලි, අඩ්ඩකාසී, මුක්තා වැනි තෙරණින් වහන්සේලාගේ චරිත ඇසුරින් පිළිතුර සකස් විය යුතුය.

( ල: 4 x 5 = 20)

(03) (1) දස සක්විතිවත් 10ම නම් කර ඇත්නම් ලකුණු 04 ම දෙන්න.

(2) දානය, ප්‍රියවචනය, අර්ථචරියාව, සමානාත්මතාව යන හතරයි. • දානය දීමයි, පාලකයා පරිත්‍යාගශීලීව කටයුතු කිරීමයි. වැසියාගේ ආර්ථික සංවර්ධනය පිණිස කටයුතු කිරීමයි. • ප්‍රියවචනය සියලු දෙනා විෂයෙහි ප්‍රියශීලී වචනයෙන් කතාකරයි. • අර්ථචරියා අනුන්ගේ යහපත පිණිස කටයුතු කිරීම. • සමානාත්මතාව උස් පහත් භේද නොසලකා සියලු ජනයා තම රටේ වැසියෝ යැයි සමව සිතා සියළු දෙනා විෂයෙහි සමානව සැලකීම.

(3) අපරිහානීය ධර්ම 07 ම පිළිවෙලින් නම් කොට තිබීම ප්‍රමාණවත්ය.

(4) 1. දානය 2. ශීලය 3. පරිත්‍යාගය 4. අවංකබව 5. මෘදු බව 6. කෙලෙස් තැවීම 7. ක්‍රෝධ නොකිරීම 8. අවිහිංසාව 9. ඉවසීම 10. අවිරෝධතාව

(5) **සේව්‍ය යුතුකම්** :- 1. සුදුසු වැඩ පැවරීම, 2. නිසිලෙස බත් වැටුප් සැකසීම, 3. ගිලන් වූ විට පිහිටවීම, 4. රස අහරින් සංග්‍රහ කිරීම, 5. සුදුසු කල්හි වැඩ පැවරීම. **සේවක යුතුකම්** :- 1. ස්වාමියාට පළමුව පිබිදීම, 2. ස්වාමියාට පසුව නින්දට යාම, 3. ලද පමණින් තෘප්තිමත්වීම, 4. තම වගකීම් මනාව ඉටු කරීම, 5. ස්වාමියාගේ ගුණ ප්‍රකාශ කිරීම.

## II කොටස

(04) (1) ● සත්වයා හා විශ්වය තුළ ඇතුළත් සියල්ලන් සියලු ක්‍රියාකාරිත්වයත් නිර්මාපක සර්වබලධාරී දෙවියකු විසින් මවන ලද වුවත් ඔහු විසින් ම පාලනය කරනු ලබන බවත් පිළිගැනීමයි. මෙය දේව නිර්මාණවාදය යනුවෙන් ද හැඳින්වේ. ● ඍග්වේදයේ දහවැනි මණ්ඩලයේ අනූවැනි යුක්තයෙහි බ්‍රාහ්මණෝස්‍ය මුඛවාසීත් බාහු රාජනමඃ කෘතඃ උදරු තද සය යද් වෛශ්‍යඃ පද්භ්‍යාම් ශුද්‍රෝ අජායත. බ්‍රහ්මයාගේ විවිධ ශරීර අවයවයන් ගෙන් මිනිස් ප්‍රජාව ප්‍රභවය ලත බව මෙයින් කිය වේ. මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් බ්‍රාහ්මණවර්ණ ය ද දෙබාහුවෙන් ක්ෂත්‍රිය වර්ණය ද දෙකළවා වලින් වෛශ්‍යවර්ණය ද යටිපතුල්වලින් ශුද්‍රවර්ණය දඹිහි වූබව ඉන් කියැ වේ.

(2) බ්‍රාහ්මණඃ- ඉගනීම, ඉගැන්වීම, යාග කිරීම, කරවීම, දන්දීම, දන්පිළිගැනීම, රාජ්‍ය අනුශාසකත්වය, ක්ෂත්‍රිය ඃ ඉගණීම, දන්දීම, යාග කිරීම, රාජ්‍ය පාලනය, වෛශ්‍ය ඃ- වෙළඳාම කෘෂිකර්මාන්තය, සත්ව පාලනය, ඉගනීම, දන්දීම, ශුද්‍ර ඃ- ඊර්ශ්‍යා නොකර ඉහළ තල වලට බැලමෙහෙවර කිරීම.

(3) ජීව විද්‍යාත්මක සාධක තුළින් හා සමාජ විද්‍යාත්මක සාධක තුළින් බ්‍රාහ්මණ වතවාද ඛණ්ඩනය විය. එම සාධක දෙක විස්තර කළයුතු අතර සමාජ ප්‍රභවය සිදුවූ අයුරු අග්ගඤ්ඤ සූත්‍රයට අනුව විස්තර කිරීම ප්‍රමාණවත්ය.

(4) කාන්තාවට, ආගමික, සමාජික, ආර්ථික සහ සියලු අංශයන්හි වරප්‍රසාද අහිමිකර තිබීම,

● බාලෙස පිතුර්වතේ තිෂ්ඨෙත් .......... යන ශ්ලෝකයෙහි කාන්තාවගේ නිදහස සීමාකර තිබීම. ● සති පූජාව, වැන්දඹුවක් ලෙස අප්‍රසිද්ධ කටුක ජීවිතයක් ගෙවීම, අර්ථ සංරක්ෂණයෙහි හා වැයකිරීමෙහි නොයෙදවිය යුතුය. ගෙදරට පමණක් සීමා කිරීම, ● මත්පැන් පානය, දුර්ජන ආශ්‍රය, සමාජයාගෙන් වෙන්ව වාසය කිරීම,දේශාටනය, අකල් නින්ද, සහ අනුන්ගේ ගෙවල්වල වාසය කිරීම, යන මේ කරුණු හය ස්ත්‍රීන්ගේ දූෂණයට හේතු බව දැක්වීම, (කරුණු 4 ක් වත් විස්තර වී තිබිය යුතුයි.) (ලකුණු 5 x 4 = 20)

(05) (1) දීඝ නිකායේ සාමඤ්ඤ ඵල සූත්‍රයෙහි මේ පිළිබඳ සඳහන් වීම, ● පුද්ගලයකු විසින් කරණු ලබන කිසිදු හොඳ හෝ නරක ක්‍රියාවක් නැතිබවද හොඳ නරක වශයෙන් ඵලයක්, විපාකයක් නොලබන බවද උගන්වයි. එය අකිරියවාදයයි. ● පව් කිරීම, අනුන්ලවා කරවීම, අනුන්ගේ අත්පා කපා දඬු මුගුරු ආදියෙන් පෙළීම, පෙළවීම, අන්සතු ධනය පැහැර ගැනීම,................. ආදී ක්‍රියාවන්හි කිසිම පාපයක් නැති බවත් දන් දෙමින් දෙවමින් යාග කරමින් කරවමින් ගංගා නදියෙන් උතුරු තෙරට නමුදු යන්නේ නම් ඒ හේතුවෙන් පිනක් නැත. පින පැමිණීමෙක් නැත ආදී වශයෙන් පින් පව් දෙකම ප්‍රතික්ෂේප කරයි.

(2) පින් පව් නොපිළිගන්නා මහා අපරාධ කරුවකු විය හැකිය, බුදු දහම ක්‍රියාවාදිය, සචේතනික ක්‍රියාවට අනුව කුසල් අකුසල් සිදුවන බව පවසයි. ඒවා දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් හෝ උපපජ්ජ වේදනීය වශයෙන් හෝ අපරාපරිය වේදනීය වශයෙන් විපාක දෙන බව පෙන්වා දෙයි. ● සබ්බ පාපස්ස අකරණං..... ආදී ගාථාවෙන් කළ නොකළ යුතු දේ පැහැදිලි කර දෙයි. ● අත්තනාවකතං පාපං අත්තනා සංකිලිස්සති.......... න අත්ත ලික්ඛෙ නසමුද්ද මජ්ජේ..... ආදී ගාථාවලින් අවධාරණ කරන්නේ පින් පව් වල විපාකයි. ● නරක ක්‍රියා තමාට දුක් දෙමින් ගොනු පසු පස එන රියසක මෙන් ද හොඳ ක්‍රියාව තමා පසු පස එන සෙවනැල්ල මෙන් ද කරන්නා අත් නොහරින බව බුදු සමයේ පිළිගැනීමයි.

(3) කර්මවාදය කර්ම දණ්ඩ නමින් හැඳින් වූ අතර මනස අප්‍රධාන කොට කාය දණ්ඩ ප්‍රබලකොට සලකා ඇත. ● මෙතුමාගේ කර්ම ඉගැන්වීම භෞතිකවාදී ස්වරූපයක් ගෙන ඇත. ● කර්මබීජ භෞතික ආත්මයේ ඇලී ඇති බැවින් ඒවා ගෙවා දමා ආත්ම පාරිශුද්ධිය ලබා ගැනීමට පංචතාපයෙන් තැවීම වැනි දැඩි ශාරීරික පීඩා දීම (අත්තකිලමතානුයෝගය) අන්තවාදීව උගන්වා ඇත. ● චාතුයාම සංවරය, පරම අවිහිංසාවාදය, පංචවිරතිය, ස්‍යාද් වාදය, ලෝකවිග්‍රහය, ඥාණ විභාගවාදය (ශ්‍රැති, මති, අවධි මනඃපර්යාය) වැනි ඉගැන්වීම් ඇසුරින් පිළිතුර සකස් වී තිබීම අවශ්‍යය.

(4) ● පූර්ණකස්සපගේ අකිරියවාදය භෞතික ස්වරූපයක් ගනී. ● මක්ඛලි ගෝසාලගේ නියති සංගතිය සංසාර සුද්ධිවාදය භෞතික පරිණාම වාදයකි. ● පකුධ කච්චායන ශාස්වත භෞතික වාදියාය. භෞතික පදාර්ථ හතක සදාතනික පැවැත්මක් ඔහු පිළිගනී. ● අජිත කේෂ කම්බලී උච්ඡේද භෞතික වාදියාය. පරම නාස්තික වාදය ඉගැන්ම යනු සුඛ පරම වාදය දැඩිව පිළිගනී. ●නිගණ්ඨ නාත පුත්ත භෞතික කර්මවාදියෙකි. ආත්මයක් කර්ම බීජයනුත් කර්මක්ෂය කිරීමේ උපක්‍රමයනුත් අවසාන ආත්ම පාරි ශුද්ධියෙන් ලබන කෛවලයත් භෞතික ස්වරූපයක් ගනී. කාය දණ්ඩය ප්‍රබලය. මනෝ දණ්ඩය දුර්වලය. බාහිර භෞතිකය මිස අධ්‍යාත්මක ශක්තියක් නොපිළිගනී. (ලඃ 5 x 4 = 20)

(06) (1) අනීශ්වරවාදය, භක්තිමාර්ගය ප්‍රතික්ෂේපකරමින් ඥාණමාර්ගය හඳුන්වා දීම, ● වයස් සීමාවකින් තොරව ආයර්‍ය බ්‍රහ්ම චර්යාව අනුගමනය කළ හැකි බව, ● වයස් සීමාවකින් තොරව ආයර්‍ය බ්‍රහ්ම චර්යාව අනුගමනය කළහැකි බව, ● නිදහස් චින්තනය ඇගයීම. ● ත්‍රිවේද ආදී ශුද්ධ වාක්‍ය දේව වාක්‍ය බැහැර කිරීම. ● අග්ගි

පාරිසුද්ධිය, උදක පාරිසුද්ධිය ප්‍රතික්ෂේප කිරීම, ● කාන්තා නිදහස අගය කිරීම වැනි කරුණු හඳුන්වා තිබීම ප්‍රමාණවත්ය. සමස්තයක් සේ සලකා ලකුණු දෙන්න. කරුණු 4 ක් තිබුණත් ප්‍රමාණවත්වය.

(2) හිරු, සඳු, වැස්ස, සුළඟ, ගංගා, දිය ඇලි, වලාකුල්, විදුලිය, මේඝය ආදී ස්වභාව ධර්මයේ සිදු වීම්, අදෘශ්‍යමාන බලවේගයක් යටතේ සිදුවන බවත් මේ සියල්ල මෙහෙයවන නිශ්පුද්ගල වූ පදාර්ථයක් හෙවත් සර්ව බලධාරි දෙවියන් නොපෙනෙන ලෙස සිටින බව පිළිගැනීම. විශ්වමාපක එම දෙවියා සර්ව බලධාරිය, සර්වව්‍යාපීය, සර්වඥය, සර්වදර්ශීය, සර්වතෝභද්‍රය, සර්ව සාධාරණය, ඔහු ඊශ්වර නමින්ද මහා බ්‍රහ්ම නමින්ද හැඳින්වේ. ලෝකයේ සියල්ල තම වසඟයට ගෙන සිත් ලෙස පාලනය කරන්නේ ඔහුය. පුද්ගලයාගේ නිර්මාපකයා ඔහුය. පුද්ගල ඕනෑ එපාකම් තීරණය කරන්නේ ඔහුය. මිනිසා දුර්වලය, බලරහිතය,තමන් කැමති පරිදි ක්‍රියා කළ නොහැකිය.

බ්‍රහ්ම ලෝකය මවන්නා, විශ්ණු ලොව ආරක්ෂා කරන්නා, ඊශ්වර ලෝකය හා සත්වයා විනාශ කරන්නා යන ත්‍රිමූර්තිය අනුව පුද්ගලයා කිසිදු ශක්තියක් හෝ බලයක් නැති දුර්වල නිවට, හීන දීන, තත්වයට පත් කර ඇත.

(3) කාලාම සූත්‍රය, විමංසක සූත්‍රය වැනි සූත්‍ර වලින් ද,

" අත්තාහි අත්තනෝ නාථො කෝහි නාථෝ පරෝසියා.....

" සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤෝ විසෝධයෙ"

" තුම්හේහි කිච්චං ආතප්පං අක්ඛාතාරෝ තථාගතා

" අත්තදීපා භික්ඛවෙ විහරංථ, අත්ත සරණා, අනඤ්ඤ සරණා යනාදී බුද්ධ දේශනා පදනම් කරගෙන පිළිතුර සකස් විය යුතුය.

(4) බ්‍රාහ්මණ වංශයෙන් උපතිස්ස කෝලිත සසුන්ගත වීම, ක්ෂත්‍රිය වංශයෙන් ආනන්ද, නන්ද, රාහුල, ආදී ක්ෂත්‍රිය වංශිකයන් සසුන්ගත වීම, වෛශ්‍ය වංශයෙන් යසකුල පුත්‍රයා ඇතුළු පිරිස සසුන්ගත වීම, ශුද්‍ර වංශයෙන්, සුනීත සෝපාක වැනි අය ද සසුන්ගත වීම (ල : 5 x 4 = 20)

(07) (1) ● සිවුවනක් පිරිස ධර්මය පිළිබඳව ව්‍යක්ත, විනීත, විශාරද, බහු ශ්‍රැත, බවට පත්වීම, ● විමුක්තිය සලසා ගැනීම සඳහා කැපවී කටයුතු කිරීම. ● අල්පේච්ඡතා, සන්තුට්ඨිතා, සුභරතා ආදී ගුණයන්ගෙන් යුක්ත වීම. ● සතර සංවර ශීලයෙන් යුක්ත වීම, ● සමථ විදර්ශනා භාවනාවන්ට උත්සුක වීම, ● ධර්මප්‍රචාරයෙහි යෙදෙමින් ලෝකාර්ථචර්යාවේ හැසිරීම, ● අවම වශයෙන් සෝතාපන්න වීමට වියර් වැඩීම, ● ප්‍රතිපත්ති පූජාවෙන් බුදුන් පුදන ශ්‍රාවකයන් වීම. ආදී කරුණු ඇතුලත් වන සේ පිළිතුර සකස් විය යුතුයි. සමස්තය සලකා ලකුණු දෙන්න.

(2) " අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී" ..................... ආදී වශයෙන් දැක්වෙන පරිදි පෘථග්ජනයා යනු අශ්‍රැතවත් තැනැත්තාය. ● ආර්ය තත්වයට පත් නොවූ ආර්ය ධර්මයෙහි නොඇලුන ආර්යධර්මය කෙරෙහි නොහික්මුණු සත්පුරුෂ ධර්මයෙහි නොබැඳුනු පුද්ගලයා අන්ධ බාල පෘථග්ජනයාය. ● යහපතෙහි යෙදෙමින් ත්‍රි ශික්ෂා මාර්ගයෙහි ගමන් ගන්නා නමුත් මාර්ගඵල නොලැබූ අය කල්‍යාණ පෘථග්ජනයෝය. ආර්යශ්‍රාවකයා යනු මාර්ගඵල ලාභී වූ ගිහි හෝ පැවිදි උත්තමයාය. සෝතාපන්න වූ ඔහුගේ සසර පැවැත්ම ආත්ම භාව 7 ක් දක්වා උපරිමයකින් යුක්තය. නියත සම්බෝධි පරායන වේ. සතර අපායට නොවැටේ. රහතන් වහන්සේ සියලු භව සංයෝජන දුර ලූ ආර්යමාර්ගය සපුරා අවබෝධ කොට විමුක්තියට පැමිණි උත්තමයාය. (සමස්තය සලකා ලකුණු දෙන්න.)

(3) භික්ෂු සංඝ යනු තුන් කුලයට අයත් භික්ෂූන්ය. භික්ෂු, භික්ෂුණී දෙපිරිසම මෙම කොටසට අයත්ය. පෘථග්ජන ශ්‍රාවක දෙපිරිසම සිටිති. ගිහි කිසිවකුත් නැත. ශ්‍රාවක සංඝ යනු සෝවාන් සකෘදාගාමී ආදී සතර මග සතර ඵලයට අයත් පිරිසයි. ගිහි පැවිදි දෙපිරිසම සිටිති. මමය මගේය ආදී වශයෙන් නොසිතති.

(4) අපැහැදුණු අයගේ පැහැදීමට ලක්වන අයුරින් හැසිරිය යුතුය. සසරදුක් නැති කර නිවන කරා ළඟාවිය යුතුය. සිගාලෝවාද සූත්‍රයේ ගිහියනට ඉටු කළයුතු යුතුකම් ද හඳුන්වා තිබීම ප්‍රමාණවත්ය. (ල: 5 x 4 = 20)

(08) (1) ● තම අවශ්‍යතා සපයා ගැනීමේදී ලෝභී වූවෝ එක් වේලකට නොව දෙවේලකට, දිනගණන කට ආහාර ගෙනගොස් ගොඩ ගසා ගැනීම. ● සමහරු හැල්කෙත් කොටුකර ගත් අතර සමහරුන්ට ඉඩම් නොමැතිවීමෙන් සමාජයේ දිළිඳු කම ඇති වීමත් ඔවුන් හොරකමට , අවිආයුධ භාවිතයට බොරුකීමට පටන් ගැනීම, ● මේ නිසා අපරාධ කරන්නන්ට දඬුවම් දීමට මහජන සම්මතයෙන් රජෙක් පත්කර ගැනීම. ඔහු කෙත්වලට අධිපති බැවින් ක්ෂත්‍රිය නම්විය.

(2) දානය, ප්‍රියවචනය, අර්ථචර්යා, සමානාත්මතාව යන කරුණු හතර කෙටියෙන් විස්තර කිරීම ප්‍රමාණවත්ය.

(3) චක්කවත්ති සීහනාද සූත්‍රයේ දැක්වෙන දස සක්විතිමත් ඇසුරින් සක්විති රජකුගේ රාජ්‍යපාලන ප්‍රතිපත්ති පැහැදිලි කළ යුතුය.

(4) කූටදන්ත සූත්‍රය ඇසුරින් කරුණු දක්වා තිබීම. ● ඒ ඒ පුද්ගලයාගේ දක්ෂතා හැකියා හඳුනා ගැනීමෙන්, ● ගොවියාට පොහොර, බීජ, ආහාර ලබාදීම, ● රාජ්‍ය සේවකයන්ට බත් සහ වැටුප් ලබා දීම, ● වෙළෙන්දන්ට ප්‍රාග්ධන පහසු කම් ලබාදීම, ● ආර්ථික අපහසුතා ඇති අවස්ථා වලදී බදු සහන ලබා දීම, ● ආර්ථික පරිහානියට හේතුවන ඇතැම් ක්‍රියා වලින් වැළකීම. ● දස සක්විති වත්මල දිළින්දන්ට ධනය දිය යුතු බව, ● "රාජා භවතු ධම්මිකෝ ආර්ථික සුරක්ෂිතතාවට හේතුවන දැහැමි රාජ්‍ය කළමනාකරණය ක්‍රමවත්